**ජපන් තානාපති කාර්යාලයය**

අංක 20, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 7
දුරකථන, 94-11-2693831~3, ෆැක්ස්, 94-11-2698629
ඊ මේල්: cultujpn@co.mofa.go.jp

**පුවත්පත් නිවේදනය**

12, සැප්තැම්බර් 2014

# නැවත පදිංචි වූවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් සඳහා ජපන් රජයේ ආධාර

"මුලතිව් දිස්ත්‍රික්කයේ නැවත පදිංචි ධීවර ප්‍රජාව නගා සිටුවීම සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම" ව්‍යාපෘතිය සඳහා ජපන් රජය මඟින් ඇමරිකානු ඩොලර් 224,380 (ආසන්නව රුපියල් මිලියන 30ක්) (ජපන් යෙන් 21,764,860) ක ආධාර මුදලක් ජපාන - රාජ්‍ය නොවන සංවිධාන සහයෝගිතා ආධාර වැඩසටහන යටතේ ලබා දුනි. මෙම ව්‍යාපෘතිය අන්තර් මානව සහයෝගීතාවය සඳහා වූ ආසියානු පැසිපික් සම්පත් මධ්‍යස්ථානය(PARCIC) මඟින් ක්‍රියාත්මක කෙරේ. PARCIC ජපන් රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර එය 2004 වසරේ සිට උතුරු පළාතේ ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන වැඩසටහන්හි නියලී සිටී.

PARCIC සංවිධානය මඟින් පොදු ළිං 18 ක් සහ ප්‍රජා ශාලා 03ක් 2013 වසරේදි ලබා දී ඇති අතර මෙම සංවිධානය මඟින් මුලතිව් ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලබන භාෂා ප්‍රවර්ධන වැඩසටහන් සහ පාසල් කාලයෙන් පසුව අමතර පන්ති පැවැත්වීම සඳහා ඉහත ප්‍රජා ශාලා යොදා ගැනේ. නැවත පදිංචි ප්‍රජාව කඩිනමින් යථා තත්ත්වයට පත් වීමත්, ප්‍රජාව අතර එකමුතු බව වර්ධනයත් සඳහා එම ක්‍රියාකාරකම් මනා පිටුවහලක් වී ඇත. PARCIC ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කරමින් ඉහත ව්‍යාපෘතිය මඟින් 'මරිටිමේපත්තු' ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා මාලු වෙළඳ මධ්‍යස්ථාන 03 ක් ලබා දීමට නියමිතය.

ගෝලීය සාමය සහ සමෘද්ධිය වෙනුවෙන් ජපන් රජය කැපවී කටයුතු කරන අතර, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විශාල සහයෝගයක් ලබා දේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජාතික සහජීවනය තුළින් දිගුකාලීන සංවර්ධනයක් සඳහා ශ්‍රී ලංකාව ධෛර්යයමත් කරමින් ලංකා සාම ක්‍රියාවලියේ සුවිශේෂී සහයකයකු මෙන්ම උතුරු පළාත නැවත නඟා සිටුවීම සහ සුභ සාධනය සඳහා කටයුතු කරන ලදි.

PARCIC ව්‍යාපෘති සම්බන්ධිකාරක 'ඉතෝ' මිය සඳහන් කලේ මෙම ව්‍යාපෘතිය ප්‍රදේශයේ ධීවර සමිති ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් ආරම්භ කරන ලද බවය. තවදුරටත් අදහස් දක්වමින්, යුධමය වාතාවරණය යටතේ පැවති තත්වය මගහරිමින් නැවත තම කටයුතු ආරම්භ කිරීමට සහ ඉතා හොඳ මට්ටමින් පවත්වා ගෙන යාමටත් ධීවර සමිති යම් ප්‍රමාණයක් සමත් වී ඇති අතර මෙම ව්‍යාපෘතිය මඟින් ධීවර සමිති කටයුතු යථා තත්ත්වයට පත් වීම කඩිනම් කිරීමටත්, ධීවර ප්‍රජාව සමස්ථයක් ලෙස ශක්තිමත් කිරීමත් අපේක්ෂා කරන බවද ප්‍රකාශ කරන ලදි.

අවුරුදු 20 කට වඩා වැඩි කාලයකට පසුව මෙම ප්‍රදේශයේ නැවත පදිංචියට පැමිණි ජනතාව තම ජීවන උපාය කටයුතු දියුණු කර ගැනිමේ දැඩි අධිෂ්ඨානයකින් පසු වන බවත්, ඒ සඳහා මෙම ව්‍යාපෘතිය මහඟු පිටුවහලක් වනු ඇතැයිද තවදුරටත් සඳහන් කරන ලදි.

මෙම ව්‍යාපෘතිය සඳහා වන ගිවිසුමට අත්සන් තැබීම ජපාන තානාපති නොබුහිතෝ හොබෝ මැතිතුමා සහ PARCIC ව්‍යාපෘති සම්බන්ධීකාරක ෆුමි ඉතෝ මහත්මිය අතර 2014 සැප්තැම්බර් 12 දින කොළඹ තානාපති නිල නිවසේදී සිදු කරන ලදි.

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය
දුරකථන 011-2693831 දිගු අංකය 225